# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2093/41 - 2018 ඔක්තෝබර් මස 18 වැනි බ්‍රහස්පතින්දා - 2018.10.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ, විසල් කුරුණෑගල ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ, කලාප අංක 2 හි (වැව රවුම පාර) මලාපවහන නල මාර්ගය එළීම සඳහා ඉඩම් කොටස්වල පරවශතා අයිතිය අත්කර ගැනීමට අවශ්‍ය ව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටස්වල පරවශතා අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2018 ඔක්තෝබර් මස 15 වැනි දින,
අංක 35, ''ලක්දිය මැදුර''
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/3/1420.

#### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 831, කුරුණෑගල නගරය උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ වෙලන්ගොල්ල ගමේ පිහිටි, පර්චස් 2.5 ක් පමණවන පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස් දෙක ඃ

කැබලි අංක ඃ 1
ඉඩමේ නම :- උයන්වත්ත
ප්‍රමාණය :- පර්චස් 0.5
මායිම්

*උතුරට* : ජේ. කේ. පී. සමන් ජයවර්ධන මහතා හිමිකම් කියන ඉඩමේ ප්‍රවේශ මාර්ගය ;
*නැගෙනහිරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස හා ජේ. කේ. පී. සමන් ජයවර්ධන මහතා හිමිකම් කියන ඉඩම ;
*දකුණට* : මාර්ග සංවර්ධන අධිකාරිය හිමිකම් කියන ඉඩම ;
*බටහිරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස.

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය* :- 01. පී. ඒ. ජේ. සී. චන්ද්‍රලතා මහත්මිය,
අංක 124, පුත්තලම් පාර,
කුරුණෑගල.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය (සම්බන්ධිතයි)

කැබලි අංක : 2
ඉඩමේ නම : උයන්වත්ත
ප්‍රමාණය : පර්චස් 2.0

මායිම්

*උතුරට* : වැව රවුම මාර්ගය ;
*නැගෙනහිරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස ;
*දකුණට* : මෙම ඉඩමේ ඉතිරි කොටස ;
*බටහිරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස.

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය* :- 01. ජේ. කේ. පී. සමන් ජයවර්ධන මහතා,
අංක 107/1, වෙලන්ගොල්ල පාර,
කුරුණෑගල.

11 - 142

---

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ, විසල් කුරුණෑගල ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ, මලාපවහන නල මාර්ග එළීම සඳහා කුරුණෑගල නොයෙල් සෙනෙවිරත්න මාවතෙහි පිහිටි ඉඩම් කොටසක පරවශතා අයිතිය අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ පරවශතා අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2018 ඔක්තෝබර් මස 15 වැනි දින,
අංක 35, ''ලක්දිය මැදුර''
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/3/1421.

උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 839, කුරුණෑගල නගරය මධ්‍යම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ කුරුණෑගල ගමේ පිහිටි, පර්චස් 1.5 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස ඃ

මායිම්

*උතුරට* : සිසිර සීමන්ත ජයසිංහ හිමිකම් කියන ඉඩම (128/ඒ, නොයෙල් සෙනවිරත්න මාවත) ;
*නැගෙනහිරට* : නොයෙල් සෙනවිරත්න මාවත ;
*දකුණට* : මෙම ඉඩමේ ඉතිරි කොටස ;
*බටහිරට* : ඩී. එම්. වීරකෝන් හිමිකම් කියන ඉඩම.

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය* :- 01. වෛද්‍ය එස්. එම්. එච්. එම්. කේ. සේනානායක මහතා,
අංක 28,
නොයෙල් සෙනෙවිරත්න මාවත,
කුරුණෑගල.

11 - 143

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.